සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය 2022
SecondTerm Test

| | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය<br>Grade 8 | ඉතිහාසය | පැය 02 යි<br>Two hours |

I කොටස

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) පණ්ඩුකාභය රජු විසින් ඉදිකරන ලද අභය වැව වර්තමානයේ හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

1. තිසා වැව  2. බසවක්කුලම වැව  3. ජය වැව  4. ගාමිණී වැව

02) " මෙම දිවයිනේ වැස්සෙන් ලැබෙන ජලය මඳකුත් ලෝකෝපකාරයකින් තොරව මුහුදට නොයේවා" යන ආදර්ශ පාඨය අනුව කටයුතු කරමින් වැව් අමුණු රාශියක් ඉදිකළ පාලකයා වන්නේ,

1. මහා විජයබාහු රජු ය.  2. දුටුගැමුණු රජු ය.
3. මහා පරාක්‍රමබාහු රජු ය.  4. ධාතුසේන රජු ය.

03) අතීත යකඩ නිස්සාරණයේ දී උඳුන් දැල්වීම සඳහා ස්වභාවික සුළං බලය යොදා ගත් බවට සාක්ෂි හමු වී ඇත්තේ,

1. සමනල වැව ප්‍රදේශයෙන් ය.  2. අලකොළවැව ප්‍රදේශයෙන් ය.
3. දෙහිගහ ඇළකන්ද ප්‍රදේශයෙන් ය.  4. අනුරාධපුර ප්‍රදේශයෙන් ය.

04) පොළොන්නරු යුගයේ සඳකඩ පහන තුළ දක්නට නොලැබෙන සත්ත්ව රූපය කුමක් ද?

1. සිංහ  2. හස්ති  3. අශ්ව  4. වෘෂභ

05) පළමුවන විමලධර්මසූරිය නමින් උඩරට රාජ්‍යත්වයට පත් වූ කොනප්පු බණ්ඩාර කුමරුගේ පියා කවුරුන් ද?

1. ජයවීර බණ්ඩාර  2. කරලියද්දේ බණ්ඩාර
3. වීරසුන්දර බණ්ඩාර  4. යමසිංහ බණ්ඩාර

- **අංක 06 සිට 10 තෙක් ප්‍රකාශ නිවැරදි නම් ( √) ලකුණ ද වැරදි නම් ( ∙) ලකුණු ද වරහන් තුළ යොදන්න.**

06) තිවංක පිළිම ගෙය ගන්ධකුටි සම්ප්‍රදායට අනුව නිර්මාණය වී තිබේ. (  )

07) උඩරට රාජධානිය වැඩිම කාලයක් පාලනය කරන ලද්දේ දෙවන රාජසිංහ රජු විසිනි. (  )

08) ලන්දේසීනගේ හා උඩරට රාජධානියේ සීමාවන් අතර පැවති මුරපොළවල් කඩවත් යනුවෙන් හඳුන්වන ලදී. (  )

09) පුනරුද සමයේ පල්ලියේ අනුග්‍රහය යටතේ පමණක් කලා නිර්මාණ බිහි විය. (  )

10) ස්පාඤ්ඤය අයිබීරියන් අර්ධද්වීපය තුළ පිහිටි රටකි. (  )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු වරහන් තුලින් තෝරා හිස්තැන තුල ලියන්න.**

11) අනුරාධපුර........................................... විහාර භූමියේ පොකුණක් කැණීමේ දී රන් කර්මාන්තශාලාවක නටඹුන් හමු වී ඇත. ( අභයගිරි / ජේතවන / ඉසුරුමුණි)

12) අතීත ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට උයනක් ඉදිකරන ලද්දෙ......................................... රජු විසිනි. (කූටකණ්ණතිස්ස / මූටසීව / දේවානම්පියතිස්ස )

13) වැව තුළ පවතින ජලය ඇළ මාර්ග වෙත නිකුත් කරනු ලබන්නේ .......................................මගිනි. ( බිසෝ කොටුව/ සොරොව්ව / පිටවාන)

14) ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ඉංග්‍රීසීන් විසින් අත්පත් කරගන්නා ලද්දේ....................................... රජු උඩරට පාලනය කරන කාලයේදී ය. ( කීර්ති ශ්‍රී රාජසිංහ/ රාජාධිරාජසිංහ/ ශ්‍රී වික්‍රම රාජසිංහ )

15) සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක ඉලිප්සාකාරව සූර්යයා වටා ගමන් කරන බව.............................. විසින් සොයා ගන්නා ලදී. (නිකලස් කොපර්නිකස් / අයිසෙක් නිව්ටන්/ ජොහැන්ස් කෙප්ලර්)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

16) මල්වතු ඔයේ ස්වභාවික ගල් තලාවක් මත වේල්ලක් බැඳ යෝධ වැවට ජලය ගෙන යාම සඳහා .......................................................................... අමුණ ඉදිකොට ඇත.

17) ජල පරිභෝජනය, අලංකාරය සහ පරිසරය සිසිල්ව තබාගැනීම යන අරමුණු තුනම ........................ පොකුණෙන් ඉටු වී ඇත.

18) පොළොන්නරුවේ පිහිටි අංක II ශිව දේවාලය.................................................... වාස්තුවිද්‍යා ශෛලිය අනුව ඉදිකර තිබේ.

19) උඩරට රාජධානි සමයේ................................................... මූලික ජන සමාජයක් දක්නට ලැබුණි.

20) රෝමයේ සිස්ටයින් දේව මන්දිරයේ සිවිලිමේ ඇඳ ඇති සිතුවම්...................................................... විශිෂ්ටතම නිර්මාණ වේ.

(ල. 2x20 -40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01) (අ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ දී ඇති අක්ෂර වලට අදාළව නම පහත සඳහන් ලැයිස්තුවෙන් තෝරා ඔබගේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න. ( ල. 08)

I) අනුරාධපුරය

II) මැණික් ගඟ

III) ත්‍රිකුණාමලය

IV) කලා වැව

V) මහනුවර

VI) ගාල්ල

VII) මහාතිත්ථ

VIII) මහියංගනය




A රූපය



(අ) I) A රූපයේ දැක්වෙන්නේ කුමක් ද?

II) එය පිහිටා ඇති නගරය නම් කරන්න.

III) මෙය ඉදිකරන ලද්දේ කවුරුන් විසින් ද?

IV) මෙම ගොඩනැගිල්ල හා සමාන තවත් ගොඩනැගිල්ලක නටබුන් දැකිය හැකි ප්‍රදේශය නම් කරන්න.

(ල. 04 )

B රූපය



ඇ) I) B රූපයේ දැක්වෙන පාලකයා නම් කරන්න.

II) රජ වීමට පෙර ඔහු හැඳින්වූ නම කුමක් ද?

III) ඔහුගේ පියා කවුරුන් ද?

IV) මෙම රජු සහ පෘතුගීසින් අතර ඇතිවූ සටන නම් කරන්න.

(ල. 04 )

02) I) A. මෙරට මහ වැව් ඉදිකිරීම ආරම්භ කළ පාලකයා සහ
B. ඔහු විසින් ඉදිකරන ලද වැවක් නම් කරන්න.
(ල. 02)

II) පහත A,B,C,D යටතේ නම් සඳහන් පාලකයන් විසින් ඉදිකරන ලද ඇළමාර්ග වරහන් තුළ ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න.

A. මහසෙන් රජු B. ධාතුසේන රජු
C. පළමු වන අග්ගබෝධි රජු D. වසභ රජු
ඇළහැර ඇළ/ අංගමැඩිල්ල ඇළ/ තල්වතු ඇළ /මිනිපේ ඇළ /යෝධ ඇළ) (ල. 04)

III) A. අනුරාධපුර යුගයේ දී ස්නානය සහ ජල පරිභෝජනය සඳහා තැන වූ පොකුණු දෙකක් නම් කරන්න. (ල. 02)
B. ජල උද්‍යානවල කැපී පෙනෙන ලක්ෂණ තුනක් නම් කරන්න. (ල. 03)

03) I) පුරාණ සෙල්ලිපිවල පහත දැක්වෙන නම් වලින් හඳුන්වා ඇත්තේ කවුරුන් ද?
A. කබර B.තොපෂ (ල. 02)

II) පහත A,B,C,D යටතේ දැක්වෙන තොරතුරු වලට අදාල පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

A. කුඩා දාගැබ් ආවරණය කිරීම සඳහා ඉදිකළ ගෘහය
B. අනුරාධපුර රාජධානි සමය ට අයත් කලාත්මක ම සඳකඩ පහණ
C. ලෙන් විහාර සම්ප්‍රදායට අයත් පිළිම ගෙය
D. රජරට ශිෂ්ටාචාර සමයට අයත් කලාත්මක ම බෝධිඝර (කිරිබත් වෙහෙර,නිල්ලක්කගම බෝධිඝරය , චේතියඝර , බඹරගස්තලාව,ශ්‍රී මහා බෝධිඝරය, අභයගිරි සඳකඩපහන , ඉසුරුමුණි සඳකඩපහන) (ල. 04)

III) A. රජරට ශිෂ්ටාචාර සමයට අයත් ආරෝග්‍ය ශාලාවල නටබුන් හමු වූ ස්ථාන තුනක් නම් කරන්න. (ල. 03)

B. පුරාණ ජනතාව විසින් සනිපාරක්ෂක කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල. 02)

04) I) මහනුවර රාජධානිය හැඳින්වීම සඳහා භාවිත කරන තවත් නම් දෙකක් ලියන්න. (ල. 02)

II) පහත A,B,C,D යටතේ දැක්වෙන තොරතුරු වලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.

A. මහනුවර ප්‍රදේශය කෝට්ටේ රාජ්‍යයෙන් නිදහස් කර ගැනීම සඳහා කැරැල්ලක් ඇති කල ප්‍රභූවරයා

B. දෝන කතිරිනා නමින් බෞතිස්ම ලැබූ කරලියද්දේ බණ්ඩාර රජුගේ දියණිය

C. දළදා පෙරහැරට දේවාල පෙරහැර ද එකතු කළ රජතුමා

D. 1803 වර්ෂයේ දී උඩරට රාජධානිය ආක්‍රමණය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

( කුසුමාසන දේවිය/ රොබට් බ්‍රවුන්රිග් / කීර්ති ශ්‍රී රාජසිංහ /ජෝතිය සිටුතුමා/ වීරසුන්දර බණ්ඩාර/ ෆෙඩ්රික් නෝර්ත් / රාජාධිරාජසිංහ/ රංගම්මා දේවිය) (ල. 04)

III) A. පළමුවන විමලධර්මසූරිය රජු සහ පෘතුගීසින් අතර ඇතිවූ පහත නම් සඳහන් සටන්වල දී පෘතුගීසී හමුදාව මෙහෙය වූ තැනැත්තා නම් කරන්න.

1. දන්තුරේ සටන 2. බලන සටන (ල. 02)

B. පළමුවන විමලධර්මසූරිය රජු බුදු දහම නගා සිටුවීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ල. 03)

05) I) A. මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා -සහ

B. මහනුවර රාජධානියේ අවසන් සිංහල පාලකයා නම් කරන්න. (ල. 02)

II) A. මහනුවර රාජධානි සමයේ මෙරටින් අපනයනය කරන ලද වෙළඳ ද්‍රව්‍ය දෙකක් සහ ආනයනය කරන ලද වෙළඳ ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ල. 02)

B. මහනුවර රාජධානියේ පහත සඳහන් කර්මාන්ත සඳහා සිද්ධියට පත්වූ ප්‍රදේශ නම් කරන්න. 1. යකඩ හා වානේ කර්මාන්තය 2. පන් කර්මාන්තය (ල. 02)

III) A. මහනුවර යුගයේ චිත්‍ර දැකිය හැකි ස්ථාන දෙකක් නම් කරන්න. (ල. 02)

B. මහනුවර රාජ්‍ය සමයේ චිත්‍ර කලාවේ දැකිය හැකි විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

06) I) ක්‍රි.ව දොළොස්වන සියවස වන විට ඉතාලියේ පැවති දියුණු වෙළෙඳ නගර දෙකක් ලියන්න. (ල. 02)

II) යුරෝපයේ පුනරුදය ඇති වීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතු දෙකක් ලියන්න. (ල. 04)

III) A. මධ්‍යතන යුගය අවසානය වන විට පහත සඳහන් යුරෝපීය රටවල බිහි වූ විශ්ව විද්‍යාල එක බැගින් නම් කරන්න.

1. ඉතාලිය 2. ප්‍රංශය 3. එංගලන්තය (ල. 03)

B. පුනරුද සමයේ දී නව උගතුන් බිහි වීම සඳහා බලපෑ සාධක දෙකක් ලියන්න. (ල. 02)

07) I) පුනරුද සමයේ දී ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය තුළ මූලිකත්වය ගත් නායකයන් දෙදෙනෙක් නම් කරන්න. ((ල. 02)

II) පහත A,B,C,D යටතේ දැක්වෙන තොරතුරු වලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.

A. මුද්‍රණ යන්ත්‍රය නිපදවීම.

B. ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය නම් චිත්‍රය නිර්මාණයය කිරීම.

C. දුරේක්ෂය නිපදවා ආකාශ වස්තු නිරීක්ෂණය කිරීම.

D. රුධිර සංසරණ පද්ධතිය සොයා ගැනීම.

(මයිකල් ආන්ජලෝ / ගැලිලියෝ ගැලලි/ වෛද්‍ය පැරසල්සස්/ නිකලස් කොපර්නිකස්/ ජොහැන්නස් ගුටෙන්බර්ග් / ලියනාඩෝ ඩාවින්චි /විලියම් හාවේ) (ල. 04)

III) A. පුනරුද සමයේ බිහිවූ විශිෂ්ට ග්‍රන්ථ කතුවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

B. පුනරුද සමයේ කලා ශිල්පවල දක්නට ලැබුණු සුවිශේෂී වෙනස්කම් තුනක් ලියන්න. (ල. 03)